2020 ජුලි 13 සිට ජුලි 17 දක්වා කාලය තුළ, තෝරාගත් රූපවාහිනී නාලිකා කිහිපයක් මගින් මෙවර මහ මැතිවරණයට තරග වදිනා ප්‍රධාන පක්ෂ කිහිපය සඳහා, සිය ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයන් තුළ මාධ්‍ය ආවරණය ලබා දී ඇති ආකාරය පහත සටහනෙන් දැක්වේ.

මෙහිදී අප විසින් පක්ෂ රැළි, පක්ෂය විසින් පවත්වන මාධ්‍ය හමු, යම් කිසි පක්ෂයකට සහාය ලබාදෙන බවට විවිධ කණ්ඩායම් විසින් පැහැදිලිවම සිදුකරන ප්‍රකාශයන්, පක්ෂ සාමාජිකයින් විසින් මැතිවරණයට අදාළ පැමිණිලි ගොනු කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට හා පොලිස් ස්ථානයන්ට යෑම්, පක්ෂයක ලාංඡනය/දුරකථන අංකය දිස්වන ලෙසින් යම් යම් පුද්ගලයින් මැතිවරණයට අදාළ මාතෘකා පිළිබඳ ප්‍රවෘත්ති විකාශයන්හි සිදුකරන කථා සහ පක්ෂ සාමාජිකයන් විසින් මැතිවරණය ගැන හා/හෝ මැතිවරණයට අදාළ මාතෘකාවක් ගැන සිදුකරන කථා සහ එවන් ආවරණයකට පෙරාතුව ඒ සම්බන්ධයෙන් නිවේදකයා විසින් කරන හඳුන්වාදීම මෙහිදී පක්ෂ සඳහා වන මාධ්‍ය ආවරණයන් යටතට ගෙන සලකා බලා ඇත. එසේම පක්ෂ සාමාජිකයින් විසින් ආගමික සාමාජිකයන් හමුවීම හෝ ආගමික උත්සවවලට සහභාගී වීම, එම සිදුවීම විකාශනය කිරීමේදී පුද්ගලයාගේ පක්ෂය පිළිබඳ සඳහනක් ප්‍රවෘත්ති පත්‍රයේ සඳහන් කිරීම, එම සිදුවීම අතරතුර මැතිවරණයට අදාළ සාකච්ඡාවක් දර්ශනය වේ නම්, හෝ ප්‍රවෘත්ති ඉදිරිපත් කරන්නා එම සිදුවීම එකට එක්ව වෙනත් මැතිවරණයට අදාළ සිදුවීමක් හඳුන්වා දෙන්නේ නම් එවැනි දෑද පක්ෂ සඳහා වන මාධ්‍ය ආවරණයන් ලෙසින් සලකා බලා ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104(ආ).(5)(අ) අනුව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදනු ලබන මාධ්‍ය උපමානයන්හි 11 වන වගන්තියට අනුව, යම් අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය වන අයුරින් හෝ වෙනත් අපේක්ෂකයෙකු හට අගතියක් වන අයුරින් යම් අපේක්ෂකයෙකු වෙත විශේෂ හා වාසිදායක සැලකිල්ලක් දක්වා ගුවන් විදුලියේ හෝ රූපවාහිනියේ ගුවන් කාලය හෝ ප්‍රවෘත්ති පත්‍ර ඉඩකඩ වෙන් කිරීම නොකළ යුතු වේ.

එම උපමානයන් වෙත ප්‍රවේශය මෙතැනින්:
http://elections.gov.lk/web/wp-content/uploads/publication/ext-gz/2178_24_S.pdf

සැලකිය යුතුයි:
පහත දත්ත සටහනේ දැක්වෙන තොරතුරු අප විසින් ඉදිරිපත් කොට ඇත්තේ පොදුජනයාට ප්‍රවේශ වීමට හැකි, වඩාත්ම යාවත්කාලීන තොරතුරු භාවිතා කරමිනි. කෙසේ වුවත් ඉහත දක්වා ඇති පරාමිතීන්ට අනුකූලව මෙහි සඳහන් නොවන නව තොරතුරු අනාවරණය වන්නේ නම්, මෙම දත්ත ඉදිරිපත් කිරීමද ඒ අනුව සංශෝධනය කිරීමට අපි කටයුතු කරමු.
#mediaethicsSL #lka #SriLanka #TVDerana #HiruTV #Swarnavahini #Rupavahini #ITN #SirasaTV
— with Sri Lanka Podujana Peramuna, United National Party, Samagi Jana Balawegaya, National People's Power - NPP and Tamil National Alliance.